මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :**PRE/2024/97** **2024.09.19**

# ජනාධිපතිවරණය - 2024 සැප්තැම්බර් 21

## ජනාධිපතිවරණ ඡන්ද විමසීමේ රාජකාරි සඳහා පත්කර ඇති සියළුම රාජ්‍ය නිලධාරීන් වෙත මැතිවරණ කොමිෂන් සභාවේ පණිවුඩය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නමවන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම සඳහා ඡන්ද විමසීම 2024 සැප්තැම්බර් මස 21 වැනි දින පැවැත්වේ. මෙම ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ කාර්යය පිළිබඳව වගකීම, ඡන්ද විමසීම් පැවැත්වීම කාර්යක්ෂමව හා අපක්ෂපාතීව ඉටු කිරීම පිළිබඳව ගෞරවනීය ඉතිහාසයක් සතු රාජ්‍ය සේවකයන් වෙත මැතිවරණ කොමිෂන් සභාව විසින් පවරා තිබේ.

මෙම ඡන්ද විමසීමේ දී තමන් සතු කාර්යභාරය යථා පරිදි ඉටු කිරීම පිණිස රජයෙන් දෛනික වැටුප් ලබන අනියම් සහායකයින්ගේ සිට තේරීම්භාර නිලධාරීන් දක්වා ඡන්ද විමසීම් රාජකාරිවල යෙදෙන සෑම රාජ්‍ය සේවකයකුම ස්වකීය කාර්යභාරය පිළිබඳ මනා අවබෝධයෙන් හා අතිශය සූපරීක්ෂාකාරීත්වයෙන් යුතුව කිසිවකුටත් විශේෂ සැලකිල්ලක් නොදක්වමින් අපක්ෂපාතීව ක්‍රියා කරනු ඇතැයි මැතිවරණ කොමිෂන් සභාව අපේක්ෂා කරයි.

ඡන්ද විමසීම් දිනයේ දී මැතිවරණ කොමිෂන් සභාවේ කාර්යභාරය පිළිබඳව සෑම ඡන්දදායකයකුම හා සෑම ඡන්ද අපේක්ෂකයකුම විශ්වාසය තබා ඇත. ඡන්ද විමසීමේ දී ඔබ සතු කාර්යභාරය ගැන සලකන විට, විශේෂයෙන්ම ඡන්ද විමසීම පැවැත්වෙන කාලය තුළ ඔබ විසින් ඡන්දදායකයන් හා ඡන්ද අපේක්ෂකයන් හා ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් සමඟ සුහද සම්බන්ධතාවෙන් ක්‍රියා කළ යුතු ය. ඔවුන් සමඟ කටයුතු කිරීමේ දී අර්ථාන්විතව, කාරුණිකව, ඉවසීමෙන් ක්‍රියා කිරීම මැනවි. මෙවන් අවධියක දී කාර්යක්ෂම ලෙස හා අනලස්ව අන්‍යෝන්‍ය සම්බන්ධතාව පවත්වාගෙනයාමෙහිලා උපාය කෞශල්‍ය, ප්‍රසන්නතාව මෙන්ම වෘත්තීය සංයමය අත්‍යවශ්‍ය ගුණාංග වේ.

මැතිවරණයක දී පැවරී ඇති නිශ්චිත රාජකාරිය මැනවින් ඉටු කිරීමට රජයේ නිලධාරීන් වශයෙන් මේ රටේ ඡන්දදායකයන්ට බැඳී සිටිමු. ඔබ වගකිව යුත්තේ මැතිවරණ කොමිෂන් සභාවට හා අධිකරණයට පමණකි. කිසිවෙකුටත් විශේෂ සැලකිල්ලක් නොදක්වන්න. ඔබගේ රාජකාරී අපක්ෂපාතීත්වය තීරණාත්මක විමසුමකි. එබැවින් ඡන්දදායකයන් රාජ්‍ය නිලධාරීන්ගෙන් අපේක්ෂිත කාර්යභාරය උපරිම මට්ටමින් ඉටු කරමු. එමගින් නිදහස් හා සාධාරණ වාතාවරණයක් තුළ තම හෘදසාක්ෂියට එකඟව ඡන්දය ප්‍රකාශ කිරීමේ හැකියාවක් පවතින බව ජනතාවට ප්‍රදර්ශනය වනු පමණක් නොව ඒත්තු යැමද සිදුවනු ඇත.

**ආර්.එම්.ඒ.එල්.රත්නායක**
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙන්)